# ඩිව් වැනි පංති හැඟීම

ඩී ඊ ඩබ්ලිව් හෙවත් ඩිව් ගුණසේකර මහතා කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයන් අමතා කරන ලද කතාවක කොටස් ශ්‍රී ලංකා රූපවාහිනී සේවයෙන් මෙන් ම ස්වාධීන රූපවාහිනියෙන් ද ප්‍රචාරය කෙරිණි. මේ කතාව කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයන්ට පමණක් කෙරුණු එකක් නම් ඒ ගැන කීමට දෙයක් නැත. එහෙත් ඩිව් ගුණසේකර මහතාට අවශ්‍ය තම කතාව මුළු රටට ම ඇසෙන්නට කියවීමට ලැබෙන්න සැලැස්වීම බව පැහැදිලි ය. ඒ පරමාර්ථය ජනමාධ්‍යකරුවන්ට ආරාධනය කිරීමෙන් හා ඔවුන් ඒ කතාවට යම් ප්‍රචාරයක් ලබාදීමෙන් ඉටුවී ඇත. ගුණසේකර මහතාගේ කතාව ප්‍රචාරය වී ඇති අයුරින් ගත්කල ඒ මහතාට කීමට අවශ්‍ය වී ඇත්තේ ඉන්දියාවේ හා ලංකාවේ මැතිවරණ ප්‍රතිඵලවල සමානකම ය. දෙරටේ ම සන්ධාන දිනා ඇතැයි ඒ මහතා කියා ඇත. එය නිවැරදි නිරීක්ෂණයකි. එහෙත් එතැනින් ඔබ්බට සිදු වී ඇත්තේ කුමක් ද? ඉන්දියාවේ හා ලංකාවේ ජයග්‍රහණය කළ සංධානවල මාක්ස්වාදී පක්ෂ ඇති බව ද පැහැදිලි ය. එහෙත් එය ද එතැනින් ඔබ්බට යන සංසන්දනයක් නො වෙයි. ඉන්දියාවේ කොංග්‍රස් පක්ෂයේ ජයග්‍රහණයට එහි මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂයෙහි ද සහාය ලැබිණි. කොංග්‍රස් සංධානයට මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂය නොමැති නම් ජයග්‍රහණය අහිමි වීමට තිබුණි.

එහෙත් ලංකාවේ තත්වය  කුමක් ද? ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ සහය නොලැබුණ ද එක්සත් ජනතා නිදහස් සංධානයට ජයග්‍රහණයකිරීමට තිබුණි. ඩිව් ගුණසේකර මහතා ද ඇමති ධුරයක් ලබාගත්තේ ජාතික ලැයිස්තුවෙන් තේරී පත්වෙමින් ය. කොමියුනිස්ට් පක්ෂයේ සහෝදර පක්ෂය වූ සමසමාජ පක්ෂයේ තිස්ස විතාරණ මහතා ද ඇමති ධුරයක් ලබාගත්තේ මනාප ක්‍රමයට හෝ ඡන්ද ලබාගෙන නො වෙයි. අද ලංකාවේ එක්සත් ජනතා නිදහස් සංධානය දිනන්නේ මාක්ස්වාදී පක්ෂවලින් ලැබෙන සහාය නිසා නො වෙයි. එහෙත් මේ පක්ෂවලින් ඇමතිවරුන් පවා පත්කරගැනීමට හැකි වී ඇත්තේ ඌරන් කැකුණ තලන විට හබන්කුකුළන්ට ද වාසි වේය යන නියමයේ පිහිටා ය. ලංකාවේ සංධානයේ මාක්ස්වාදී ජනතා විමුක්ති පෙරමුණක් ඇතැයි කිසිවකුට තර්කයක් ඉදිරිපත් කළ හැකි ය. එහෙත් ජනතා විමුක්ති පෙරමුණේ ඇමතිවරයකු වූ විජිත හේරත් මහතා වැන්නන් ලංකාවේ සංස්කෘතිය ගැන කුමක් දෙඩෙව්ව ද  ජනතා විමුක්ති පෙරමුණට ජනතාව ඡන්දය දුන්නේ එය සිංහලයන්ගේ විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්ගේ පක්ෂයක් ලෙස සලකමින් ය. ඒ පක්ෂයට දෙමළ ජනයා තබා මුස්ලිම් ජනයාගෙන්වත් එතරම් ඡන්ද නො ලැබෙයි. අංජන් උම්මා මහත්මිය දිනන්නේ සිංහල බෞද්ධයන්ගේ ඡන්දවලින් මිස මැලේ ජනයාගේ ඡන්දවලින් නො වෙයි. අද මාක්ස්වාදී පක්ෂවලට මෙරට සිදු වී ඇති දෙය ජනතා විමුක්ති පෙරමුණ හැරෙන්නට අනෙක් මාක්ස්වාදී පක්ෂවලට ලැබෙන ඡන්ද සංඛ්‍යාවෙන් පැහැදිලි වෙයි. ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය හෝ ලංකා සමසමාජ පක්ෂය හෝ සංධානයෙන් බැහැරව මැතිවරණයට ඉදිරිපත්වුවහොත් ඡන්ද කීයක් ලැබෙන්නේ දැයි ඩිව් ගුණසේකර මහතා සිතන්නේ ද? වාසුදේව නානායක්කාර, වික්‍රමබාහු කරුණාරත්න, සිරිතුංග ජයසූරිය, විජේ ඩයස් ආදීන්ට සහ ඔවුන්ගේ පක්ෂවලට ලැබෙන ඡන්ද ගැන ඩිව් ගුණසේකර මහතාට අවබෝධයක් නැතැයි නො සිතමු.

ජාතික හෙළ උරුමයේ රූපවාහිනී භික්ෂූන්ගේ ජාතිකත්ව රඟපෑම ගැන වැටහීමක් නොමැති ජනතාවගෙන් ලක්ෂ පහක් පමණ පිරිසක් ඒ පක්ෂයට ඡන්දය දුන්හ. තිලක් කරුණාරත්න මහතා පුවත්පත්වලට කුමක් කීවත් ඒ පක්ෂයෙහි ඒ මහතාගේ බලය කෙමෙන් ගිලිහී යයි. දැන් එහි ඇත්තේ ජනතා මිතුරන්ගේ හා රූපවාහිනී භික්ෂූන්ගේ අශුද්ධ සන්ධානයකි. එය තවත් නායකත්ව පොරයක් ද වෙයි. ඒ කෙසේ වෙතත් දැනට මෙරට ජනතාව ජනතා විමුක්ති පෙරමුණට මෙන් ම ජාතික හෙළ උරුමයට ද ඡන්දය දෙන්නේත් මාක්ස්වාදී පක්ෂ ලෙස පෙනීයන පක්ෂවලට ඡන්දය නොදෙන්නේත් මුලින් කියන ලද පක්ෂ දෙක සිංහල බෞද්ධයන් නියෝජනය කරන්නේ යැයි ජනතාව සිතන බැවිනි.

ඩිව් ගුණසේකර මහතා මැතිවරණ ප්‍රතිඵල විග්‍රහකර ඇත්තේ කසිකබල් මාක්ස්වාදී වචන මාලාවක් යොදාගනිමිනි. ඊනියා පීඩිත පංතියක් සංධානය වටා රොක් වී ඇතැයි කීමට ඒ මහතා උත්සාහ දරයි. මිනිසුන්ට ආර්ථික ප්‍රශ්න වැදගත් බව සැබෑ ය. එහෙත් මිනිසුන්ට බොහෝ අවස්ථාවල ජාතික හා සංස්කෘතික ප්‍රශ්න ආර්ථික ප්‍රශ්නවලට වඩා වැදගත් වෙයි. ඒ එසේ වන්නේ ඇයි දැයි තේරුම්කිරීමට බටහිර විද්‍යාත්මක යැයි පුරසාරම්බාන මාක්ස්වාදය අසමත් වෙයි. ව්‍යාජ විඥානය හෝ සංස්කෘතිය අධිනිර්ණය වී ඇතැයි (ඕවර ඩිටර්මින්ඩ්) ආදී ඊනියා ප්‍රවාද බටහිර විද්‍යාවට අනුව ප්‍රවාදවත් නො වෙයි.  බටහිර භෞතික විද්‍යාවෙහි එවැනි සංකල්ප ගැරඬි හැවක් මෙන් කෙව්ටකින් ගෙන

© Prof. Nalin De Silva

විසිකෙරෙයි. එහි විද්‍යුත් චුම්බක ක්ෂේත්‍රය හෝ වෙනත් යමක් අධිනිර්ණය වී ඇතැයි කියන්නෙක් නැත. ව්‍යාජ විඥානය, අධිනිර්ණය ආදියෙන් කියැවෙන්නේ එකම එක දෙයක් පමණකි. එනම් මාක්ස්වාදයේ පංති විග්‍රහය ප්‍රතික්ෂේප වී ඇති බවත් මාක්ස්වාදය ඒ පිළිගැනීමට සූදානමක් නොමැති බවත් ය. ඩිව් ගුණසේකර මහතා මැතිවරණ ප්‍රතිඵල විග්‍රහකිරීමට යොදාගන්නේ කිසිදාක වලංගු නොවූ කසිකබල් සංකල්ප හා ප්‍රවාද ය.

මෙරට ජනමතය පාර්ලිමේන්තුවේ නියෝජනය නොවන බව ඇතැමුන් කියන්නේ සමානුපාතික ඡන්ද ක්‍රමය අනුව සංධානයට ආසන සංඛ්‍යාවක් අහිමි වී තිබීම හේතුකොටගෙන ය. එහෙත් බොහෝ දෙනාට අමතකවන කරුණක් වෙයි. තිස්ස විතාරණ, ඩිව් ගුණසේකර වැනි මහතුන් ඇමතිකම් ලබන්නේ ද ජනමතයට පිටින් යෑමෙන් ය. කිසිදාක මැතිවරණයකින් ජයගැනීමට නොහැකි මෙවැන්නෝ ඊනියා ජාතික ලැයිස්තුවක් හරහා ඇමතිකම් ලබනවා පමණක් නොව ජනතාව ප්‍රතික්ෂේප කරන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ද වරම් ලබති. ඩිව් ගුණසේකර මහතා ඒකීය ලංකාවකට විරුද්ධ ය. ඔහුගේ පක්ෂය බලය විමධ්‍යගතකිරීමට පක්ෂ ය. ජනතාව ඒ පක්ෂය ප්‍රතික්ෂේප කරන්නේ ජනතාවට ඒකීය ලංකාවක් අවශ්‍ය බැවින් ය. එසේ තිබිය දී ගුණසේකර මහතාට ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ ඇමති ධුරය ලැබී ඇත. මේ ජනමතය පිළිබිඹු වීමක් නොව චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය විසින් ජනමතය ගසාකනු ලැබීමකි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ඉතා දඬබ්බරකාරී ආකාරයකට සිංහලයන්ගේ ජනමතය පිළිබිඹු නොවන ආකාරයකට වැඩකිරීමට උත්සාහකරයි. ඩිව් ගුණසේකර මහතාට අද අවශ්‍ය වී ඇත්තේ ඊනියා පංති හැඟීමකින් තොන්ඩමන් මහතාගේ කම්කරු කොංග්‍රසය  සංධානයට එකතුකර ගැනීම ය. තොන්ඩමන් මහතා කුමක් කළත් ඒ මහතා වටා සිටින කම්කරුවන් වැදගත් යැයි ගුණසේකර මහතා කියයි. එහෙත් මෙහි දී ප්‍රශ්න දෙකක් පැනනගියි. පළමුවෙන් ම තොන්ඩමන් මහතා නැතිව ඒ කම්කරුවන් සන්ධානයට ගන්නේ කෙසේ ද යන්න ය. දෙවනුව ඒ කම්කරුවන්ට අද ඇත්තේ කම්කරු හැඟීම ද එසේත් නැත්නම් දෙමළ ජතිවාදී විඥානය ද යන්න ය.

ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂයේ පරාජය හුදු ආර්ථික කරුණු මත පමණක් විග්‍රහකිරීමට ඉංගිරිසින්ගෙන් දේශපාලන විද්‍යාව උගත් ඉන්දියාවේ උගත්තු ඉදිරිපත්වූහ. ඉංගිරිසියෙන් පළවන පුවත්පත් සඟරා කියවා ජාත්‍යන්තර දේශපාලනයෙහි විශාරදයන් බවට පත්වී සිටින මෙරට පරිවර්තන උගත්තු ද ඒ මත සිංහලෙන් පුනරුච්චාරණය කළහ. ඉන්දියාවේ කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්වාදී) වැනි පක්ෂවලට ඉන්දියානුවන් තවමත් ඡන්දය දෙන්නේ කම්කරු පංති හැඟීමකින් නොව භාරතීය ජනතා පක්ෂයේ ජාතිකත්වය ගැන ජනතාවට සැක ඇති වී තිබෙන බැවින් ය. කොකා කෝලා බෝතල කුඩුකරමින් බලයට පැමිණි ජනතා පක්ෂය ජාතිකත්වය (හින්දුත්වය) පසෙක ලා ඇමරිකාව පසුපස ගියේ ය. ඉන්දියාවේ ඡන්දය ලැබෙන මාක්ස්වාදී පක්ෂවල ද යම් ජාතිකත්වයක් ඇත. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහිවීමට පෙර ලංකා සමසමාජ පක්ෂය වටා ද ජාතිකත්ව හැඟීමකින් ඇතැම් භික්ෂූන් වහන්සේ ද ගිහියන් ද එකතු වූ බව අමතක නොකළ යුතු ය. සමසමාජ පක්ෂයේ අධිරාජ්‍ය විරෝධය ජාතිකත්වයක් ඇති අය ආකර්ෂණය කිරීමට සමත්විය. සමසමාජයට පංතිය පමණක් වැදගත් වූ පසු එය අභාවය ඇරඹිණි. පංතිය යනු ජාතිය මෙන් මිනිසුන් බැඳ තබන්නක් නො වෙයි. ඉංගිරිසියෙන් ඩිව් යනු පින්න ය (පිනිබිඳු). පංති හැඟීම ඩිව් වැනි ය.

පංතිය පදනම් කරගෙන මාක්ස් මහා වැල්වටාරමක් ලිව්වේ ය. ඒ භෞතික විද්‍යාවේ වියුක්ත (ඇබ්ස්ට්‍රැක්ට්)  පොදු (ජෙනරල්) ප්‍රවාද අනුව ගොතන ලද්දකි. මෙවැනි ප්‍රවාද හෙවත් පාර ආඛ්‍යාන (මෙටා නැරේටිව්) බටහිර සමාජයීය විද්‍යාවන්හි වලංගු නොවන බව බටහිරයෝ ම දනිති. සමාජයීය විද්‍යාවන්හි තබා ජීව විද්‍යාවන්හිවත් එවැනි ප්‍රවාද වලංගු නොවන බව අවලංගු වෙමින් පවතින ඩාවින්ගේ පරිණාමවාදයෙන් කියැවෙයි. වියුක්ත පොදු ප්‍රවාද වලංගුවන්නේ සිත් පිත් නැති භෞතික වස්තූන් ගැන හදාරණ භෞතීය විද්‍යාවන්හිත් භෞතිකවත් නොවන ගණිතමය භූතාර්ථ (මැතමැටිකල් එන්ටිටීස්) ගැන හදාරණ ගණිතයේත් පමණ ය. ජීව විද්‍යාවේ ජීවයක් නැති මූලික කොටසක් අද ඩී එන් ඒ අණුව හරහා රසායන විද්‍යාවේ (හා භෞතීය විද්‍යාවන්හි) කොටසක් බවට පත්වෙමින් ඇත. එහෙත් තණ අග පිණි බිඳු වැනි පණක් ඇති ප්‍රාණීන්ට පාර ආඛ්‍යාන ගෙතිය හැකි නො වෙයි. මිනිස්සු ද ප්‍රාණීහු වෙති.

© Prof. Nalin De Silva